පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 09 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **කතෝලික ධර්මය**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි.

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් දෙකක් වන්නේ,
    (1) උත්පත්ති , ප්‍රේම ගී (2) ජෝබ්, හිතෝපදේශය
    (3) ගීතාවලිය, හොසියා (4) ජෝනා, එස්තර්

02. නව ගිවිසුමේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථය වන්නේ,
    (1) හේබ්‍රෙව් (2) ශු. මාක් ශුභාරංචිය
    (3) එළිදරව්ව (4) දානියෙල්

03. 'සියොන්' යනුවෙන් හැඳින්වෙන්නේ,
    (1) ජෙරුසලම ය. (2) නාසරෙත් ය.
    (3) ගලීලය ය. (4) බෙත්ලෙහෙම ය.

04. රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීම අරමුණු කරගෙන ලියැවුණු ශුභාරංචිය වන්නේ,
    (1) ශු. මතෙව් ශුභාරංචිය යි. (2) ශු, ජොහාන් ශුභාරංචිය යි.
    (3) ශු. ලූක් ශුභාරංචිය යි. (4) ශු. මාක් ශුභාරංචිය යි.

05. දෙවියන් වහන්සේ ආදම් සහ ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ,
    (1) ඔවුන් සමාජයෙන් කොන් කළ බව යි. (2) ආදරය හා රැකවරණය යි.
    (3) පාපයේ බරපතලකම යි. (4) ඔවුන් තම තත්වයෙන් පහලට වැටුණු බව යි.

06. දෙවියන් වහන්සේ නෝවා සමඟ කළ ගිවිසුමේ සංකේතය කුමක්ද?
    (1) චර්මඡේදනය (2) වළාකුළු
    (3) දේදුන්න (4) බැටළුවා

07. වීර නායකයන් සිටි කාලය වන්නේ,
    (1) ක්‍රි.පූ. 1200 - 1050 (2) ක්‍රි.පූ. 1300- 1200
    (3) ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100 (4) ක්‍රි.ව. 1200 - 1050

08. ජෙරුසලම් දේව මන්දිරය ඉදි කළ රජතුමා වන්නේ,
    (1) දාවිත් ය. (2) සලමොන් ය.
    (3) සාවුල් ය. (4) හෙරෝද් ය.

09. වයස අවුරුදු හතට පෙර සිදු කරන වැරදි හඳුන්වනු ලබන්නේ,
    (1) මුල් අගුණ පව් ලෙස ය. (2) මරණීය පව් ලෙස ය.
    (3) බරපතල පව් ලෙස ය. (4) සුළු පව් ලෙස ය.

10. ශුද්ධ වූ අගුස්තීනු තුමාට සිත් හැරීම සඳහා මගපෙන්වීම් ලැබුනේ,

(1) ශුද්ධ වූ ජස්ටින් තුමා ගෙනි. (2) ශුද්ධ වූ අන්තෝනි තුමා ගෙනි.

(3) ශුද්ධ වූ බෙනඩික් තුමා ගෙනි. (4) ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමා ගෙනි.

11. රෝගීන් ආලේප කිරීමේ පිළිවෙත අපෝස්තුළුවරුන් ක්‍රියාත්මක කළ ආකාරය සඳහන් වන්නේ,

(1) රෝම ලිපියේ ය. (2) ජාකොබ් ලිපියේ ය.

(3) ජොහාන් ලිපියේ ය. (4) ශු. ලූක් ශුභාරංචියේ ය.

12. රෝගීන්ගේ ආලේපනයේ දී ශුද්ධ වූ තෛලයෙන් ආලේප කරනු ලබන්නේ රෝගියාගේ,

(1) නළල හා දෑත් ය. (2) දෑත් හා දෙපය ය.

(3) නළල හා හිස ය. (4) ළය හා දෑත් ය.

13. දෙවියන් වහන්සේට අයිති වස්තුවක් අප නතු කර ගැනීමට ගන්නා වූ උත්සහය වන්නේ,

(1) අන් සතු දේපළ පැහැර ගැනීම යි. (2) දේවස්ථානයේ වඩු සොරා ගැනීම යි.

(3) වංචනික ලෙස මුදල් ඉපයීම යි. (4) සිය දිවි හානිකර ගැනීම යි.

14. තම සහෝදර ආබෙල්ව මරා දැමීමට කායින්ගේ සිත යොමු කළ මුල් අගුණ පාපය වන්නේ.

(1) රාගය යි. (2) උඩඟුව යි.

(3) ඊර්ෂ්‍යාව යි. (4) කෑදරය යි.

15. 'පරදාර සේවනය කරන්නා අනුවනයෙකි. ඔහු තම ජීවිතය නාස්තිකර ගන්නෙකි.' මෙලෙස සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

(1) හිතෝපදේශය යි. (2) ගීතාවලිය යි.

(3) ශු. මතෙව් ශුභාරංචිය යි. (4) කොරින්ති ලිපිය යි.

16. ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමාගේ මංගල්‍යය සමරනු ලබන්නේ,

(1) ජනවාරි 21 ය. (2) මාර්තු 10 ය.

(3) ජූලි 06 ය. (4) අගෝස්තු 15 ය.

17. ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා යාච්ඤාව තුළින් වර්ෂාව ලබා දුන්නේ,

(1) මහනුවර දී ය. (2) හලාවත දී ය.

(3) යාපනයේ දී ය. (4) නුවරඑළියේ දී ය.

18. සමිඳාණන් වහන්සේ ගිබියොන්හි දී රාත්‍රියේ ස්වප්නයකින් දර්ශනය වූයේ,

(1) දාවිත් රජතුමාට ය. (2) සාවුල් රජතුමාට ය.

(3) සලමොන් රජතුමාට ය. (4) සාමුවෙල්ට ය.

19. භාවනාව යනු,

(1) නිහඬ වීමකි. (2) එතෙර වීමකි.

(3) කැප කිරීමකි. (4) සොයා යාමකි.

20. 'අසිපා' යනු,

(1) ආසියානු රදගුරු සම්මේලනය යි. (2) ආසියානු සංවර්ධනය ජාතික ප්‍රතිපත්තිය යි.

(3) ආසියානු ඒකාග්‍ර පෝෂණ සේවා යොමුව යි. (4) ආසියාතික යැදුම් යොමුව යි.

(ලකුණු 2X20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ පොත් බෙදිය හැකි කාණ්ඩ **හතරක්** නම් කරන්න.
   (ii) ගීතාවලියෙහි ගීත වර්ගීකරණයට අනුව ගීතිකා වර්ග **හතරක්** නම් කරන්න.
   (iii) ශුද්ධ වූ ජොහාන් ශුභාරංචියේ සඳහන් 'මම වෙමි' ප්‍රකාශන **හතරක්** ලියන්න.
   (iv) සාමුවෙල් නම් විනිශ්චයකාරයා පිළිබඳ වැදගත් කරුණු **හතරක්** ලියන්න.
   (v) ස්වර්ගයට මොර ගසන පව් **හතරක්** ලියන්න.

(ලකුණු 4X5=20)

02. (i) නව ගිවිසුමේ දක්නට ලැබෙන සංදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
   (ii) ගීතාවලිය හඳුන්වන වෙනත් නම් **තුනක්** ලියන්න. (ලකුණු 03)
   (iii) ශුද්ධ බයිබලය අපට වැදගත් වන ආකාර **පහක්** විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) උත්පත්ති පොතේ පාපයට වැටීමේ සිද්ධිය තුළ දෙවියන් වහන්සේ දඬුවම් දුන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02)
   (ii) වරදට වැටුණු කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් (පාපයේ ප්‍රතිඵල) **තුනක්** ලියන්න. (ලකුණු 03)
   (iii) ඔබ වෙත පැමිණෙන පරීක්ෂා ජය ගනිමින් කිතුනු දරුවකු ලෙස ජීවත් වීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග **පහක්** විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) පාපයට ලැබෙන දඬුවම් **දෙවර්ගය** ලියන්න. (ලකුණු 02)
   (ii) ශුද්ධාත්මයාණන්ට විරුද්ධ පව් **තුනක්** ලියන්න. (ලකුණු 03)
   (iii) පාපයට වැටී සිටින මිතුරෙකුට දේව ආදරය අත්දැකීමට දේව දරුවෙකු ලෙස ඔබ සහය වන ආකාර **පහක්** විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) හයවන සහ නවවන දේව පනත් **දෙක** ලියන්න. (ලකුණු 02)
   (ii) හයවන දේව පනතට විරුද්ධ ක්‍රියා **තුනක්** ලියන්න. (ලකුණු 03)
   (iii) හයවන සහ නවවන දේව පනත්වලට අනුව පිවිතුරු දිවියක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ දක්නට ලැබෙන උදාන ගී **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
   (ii) යාච්ඤාවේ ප්‍රභේද **තුන** නම් කරන්න. (ලකුණු 03)
   (iii) කිතුනුවකු ලෙස අපගේ ආධ්‍යාත්මික ජීවිතයට යාච්ඤාව වැදගත් වන ආකාරය කරුණු **පහකින්** පෙන්වා දෙන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   (කරුණු **පහක්** වත් ඇතුළත් වන සේ ලියන්න.) (ලකුණු 5X2=10)
   (i) ශුද්ධ වූ මරිය ගොරෙත්ති මුනිතුමිය    (ii) ගබ්සාව
   (iii) සමදර්ශක ශුභාරංචි    (iv) දාවිත් රජතුමා

***

**අවසාන වාර පරීක්ෂණය - 2022**
**කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය**
**09 ශ්‍රේණිය**

## I කොටස

01. (2) ජෝබ්, හිතෝපදේශය
02. (3) එළිදරව්ව
03. (1) ජෙරුසලම ය.
04. (4) ශු. මාක් ශුභාරංචිය යි.
05. (2) ආදරය හා රැකවරණය යි.
06. (3) දේදුන්න
07. (1) ක්‍රි.පූ. 1200 - 1050
08. (2) සලමොන් ය.
09. (4) සුළු පව් ලෙස ය.
10. (4) ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමා ගෙනි.
11. (2) ජාකොබ් ලිපියේ ය.
12. (1) නළල හා දෑත් ය.
13. (4) සිය දිවි හානිකර ගැනීම යි.
14. (3) ඊර්ෂ්‍යාව යි.
15. (1) හිතෝපදේශය යි.
16. (2) මාර්තු 10 ය.
17. (1) මහනුවර දී ය.
18. (3) සලමොන් රජතුමාට ය.
19. (4) සොයා යාමකි.
20. (3) ආසියානු ඒකාග්‍ර පෝෂණ සේවා යෙමුව යි.

(ලකුණු 2X20=40)

## II කොටස

01. (i) පංච පුස්තකය/ ඉතිහාස පොත්/ ප්‍රඥා සාහිත්‍යය/ දිවැසිවර ග්‍රන්ථ/ එළිදරව් සාහිත්‍යය

(ii) ප්‍රශංසා ගීත/ විලාප ගීත/ තුති දීමේ ගීතිකා/ ප්‍රඥා ගීතිකා/ රාජකීය ගීතිකා/ සියොන් ගීතිකා/ විශ්වාසයේ ගීතිකා

(iii) ජීවනදායක භෝජනය මම වෙමි./ ලෝකයේ ආලෝකය මම වෙමි/ බැටළුවන්ට දොරටුව මම වෙමි/ මහ යහපත් එඬේරා වෙමි/ පුනර්ජීවනය ද ජීවනය ද මම වෙමි/ මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි./ සැබෑ මිදිවැල මම වෙමි.

(iv) අවසාන විනිශ්චයකාරයා ය/ දිවැසිවරයෙකි/ පූජකයෙකි/ සාවුල් හා දාවිත් රජකමට අභිෂේක කළේ සාමුවෙල් ය.

(v) මිනී මැරීම/ දූගීන්ට හිංසා කිරීම/ සේවකයින්ගේ වැටුප් වංචා කිරීම/ අස්වාභාවික මෛථුන්‍ය

(ලකුණු 4X5=20)

02. (i) රෝම/ 1කොරින්ති/ 2කොරින්ති/ ගලාති/ එපීස/ පිලිප්පි/ කොලොස්සි/ 1 තෙසලෝනික/ 2 තෙසලෝනික/ 1 තිමෝති/ 2 තිමෝති/ තීතස්/ පිලමොන්/ හෙබ්‍රෙව්/ ජාකොබ්/ 1 පේදුරු/ 2 පේදුරු/ 1 ජොහාන්/ 2 ජොහාන්/ 3 ජොහාන්/ ජූද් (ලකුණු 02)

(ii) ඉශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත/ ගී කළඹ/ ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත (ලකුණු 03)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03. (i) සර්පයා/ ආදම්/ ඒව (ලකුණු 02)

(ii) සාප ලද්දෙක් වීම/ පොළොවෙන් නෙරපා දැමීම/ වගා කරන විට පලදාව නොදීම/ ගෙයක් දොරක් නැති මිහි පිට ඉබාගාතේ යන මිනිසකු වීම (ලකුණු 03)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) සදාකාලික දඬුවම/ කාලීන දඬුවම (ලකුණු 02)

(ii) තම ගැලවීම ගැන බලාපොරොත්තු කඩ කර ගැනීම/ පාප ක්ෂමාව හා යහපත් ක්‍රියාවන්හි පින් හේතු නොමැති ව ගැලවීම බලාපොරොත්තු වීම/ ආගමික සත්‍යතා ප්‍රතික්ෂේප කිරීම/ අනුන් ලබන දේව වරප්‍රසාද ගැන ඊර්ෂ්‍යා කිරීම/ පාපයෙහි ඇලී ගැලී සිටීම/ පසුතැවිලි නොවී මරණයට පත් වීම (ලකුණු 03)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. (i) කාමමිථ්‍යාචාරය නොකරව/ පරදාල ආලය නොකරව (ලකුණු 02)

(ii) අසභ්‍ය පොතපත කියවීම/ අසභ්‍ය චිත්‍ර හා චිත්‍රපට නැරඹීම/ බහු භාර්යා හා බහු පුරුෂ සබඳතා/ ස්ත්‍රී දූෂණ/ සම ලිංගික සබඳතා/ බාල අපයෝජන/ පූර්ව ලිංගික සබඳතා (ලකුණු 03)

(iii) ආත්ම දමනය/ පරාර්ථකාමී මිත්‍රත්වය/ යාච්ඤාව/ ශරීරයට ගරු කිරීම/ ලිංගිකත්වයට ගරු කිරීම/ සක්‍රමේන්තු තුළින් ලබන දේව වරප්‍රසාද ආදී පිළිතුරු (ලකුණු 05)

06. (i) මරියතුමියගේ උදාන ගීය/ සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීතය/ සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය (ලකුණු 02)

(ii) වාචික යැදුම/ භාවනාව/ ධ්‍යානයට සමවැදීම (ලකුණු 03)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07. (i) පෙළ පොත පිටු අංක 86 (ii) පෙළ පොත පිටු අංක 77-78

(iii) පෙළ පොත පිටු අංක 15-17 (iv) පෙළ පොත පිටු අංක 43-45 (ලකුණු 5X2=10)

***


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න